# මද්‍යසාර භාවිතයේ ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණයේ සංක්ෂිප්ත වාර්තාව



මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC) 1998 වසරේ සිට, මද්‍යසාර භාවිතය පිළිබඳ දක්නට ඇති ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණයක් වාර්ෂිකව සිදු කරනු ලබන අතර, ශ්‍රී ලංකාව තුළ මද්‍යසාර භාවිතය සම්බන්ධයෙන් වන වත්මන් ප්‍රවණතා සිතියම්කරණය හා ගවේෂණය කිරීම එහි මූලික අරමුණ වේ. මෙම සමීක්ෂණය හරස්කඩමය අධ්‍යයනයක් ලෙස සිදු කරනු ලබන අතර, 2023 වසරේ අගෝස්තු මාසයේදී කොළඹ, ගම්පහ, මහනුවර, කුරුණෑගල සහ යාපනය යන දිස්ත්‍රික්ක පහ පුරා විහිදෙන පරිදි සමීක්ෂණය සිදු කරන ලදී. තෝරා ගත් දිස්ත්‍රික්ක පහ තුළ ජීවත් වන වයස අවුරුදු 15 සහ ඊට වැඩි පිරිමි ජනගහනය සමීක්ෂණයට ඇතුළත් විය. බහු අදියර නියදි සැලැස්මක් භාවිතයෙන් ප්‍රතිචාරකයින් තෝරා ගනු ලැබූ අතර, පුහුණු පර්යේෂකයන් විසින්, වලංගු ප්‍රශ්නාවලියක් භාවිත කරමින් දත්ත රැස්කරන ලදී. පර්යේෂණයට සහභාගි වූවන්ගේ වයස, අධ්‍යාපන තත්වය, රැකියා ආදී ජීව දත්ත තොරතුරු, මද්‍යසාර භාවිතය ආරම්භ කිරීම සඳහා බලපෑ සාධක සහ මද්‍යසාර පරිභෝජන රටාවන් පිළිබඳ තොරතුරු සමීක්ෂණය හරහා ලබා ගන්නා ලදී.

"මද්‍යසාර භාවිතා කරන්නන්" සමීක්ෂණය මෙහෙයවන ලද කාල සීමාවේදී, පසුගිය දින 30 ඇතුළත මද්‍යසාර භාවිතා කළ පුද්ගලයින් මද්‍යසාර භාවිතා කරන්නන් ලෙස සලකන ලදී.



30.6%

**සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් 30.6% ක් මද්‍යසාර භාවිතා කරන්නන් විය. (අවුරුදු 15ට වැඩි පිරිමි)**

**මද්‍යසාර භාවිතා කරන පිරිසෙන් 22%ක් අවුරුදු 15 - 21 අතර වයසේ පසුවන්නන් වේ.**

නීතිමය තහනම් නොසලකා බාල වයස්කාර පුද්ගලයන්ට මද්‍යසාර ප්‍රවර්ධනය සහ අලෙවිය මෙම තත්වයට බලපාන අතර මෙම ගැටලුව සාධනීය ලෙස ආමන්ත්‍රණය කිරීමේ වැදගත්කම එමගින් අවධාරණය කරයි.

**මද්‍යසාර භාවිතයට මුලපිරීම හා සම්බන්ධ වර්තමාන ප්‍රවණතාවයක් නම්, මද්‍යසාර භාවිතය ආරම්භ කිරීම බොහෝ විට සිදුව ඇත්තේ බිග් මැච් (Big Match) තරඟ අවස්ථා වැනි විශාල පුද්ගල ඒකරාශී වීම් අතරතුර දී වීමයි. සමවයස් මිතුරු කණ්ඩායම්හි බලපෑම, මද්‍යසාර භාවිතයට මුලපිරීම සඳහා බලපාන සැලකිය යුතු සාධකයක් බව එමගින් පැහැදිලි වේ.**

**වර්තමාන මද්‍යසාර භාවිතා කරන්නන් වැඩි ප්‍රතිශතයක්, ආරම්භයේදී භාවිත කරන ලද මද්‍යසාර වර්ගය බියර් වේ. (52.6%).**



විශේෂයෙන් ඉලක්ක කරන ලද පාසල් වයසේ ළමුන් සහ තරුණයින් අරමුණු කර ගනිමින් මද්‍යසාර කර්මාන්තය මඟින් භාවිත කරන මෙවැනි ප්‍රවර්ධන උපක්‍රම කෙරෙහි පාසල් හා අනෙකුත් අදාළ බලධාරීන්ගේ නිසි අවධානය සහ ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වේ.

**සමීක්ෂණයට සහභාගී වූවන්ගෙන් 19.9% ක් සමීක්ෂණය මෙහෙයවන කාලය වන විට මද්‍යසාර භාවිතයෙන් ඉවත් වීමට සමත්ව ඇති අතර මද්‍යසාර භාවිතය නිෂ්ඵල හැසිරීමක් ලෙස වටහා ගැනීම, සෞඛ්‍යමය කාරණා සහ මූල්‍යමය ගැටලු මද්‍යසාර භාවිතයෙන් ඉවත් වීම සඳහා බලපෑ වඩාත් ප්‍රමුඛ සාධක ලෙස වාර්තා විය.**

මෙම ධනාත්මක ප්‍රවණතාවය වර්ධනය කිරීම සඳහා මද්‍යසාර භාවිතයේ ඇති හිස්බව, මද්‍යසාර භාවිතයේ සෞඛ්‍ය, සමාජීය සහ ආර්ථික බලපෑම් පිළිබඳ දැනුම තව දුරටත් ව්‍යාප්ත කිරීම අත්‍යවශ්‍ය වන අතර, එමගින් මද්‍යසාර භාවිතයෙන් ඉවත් වීමට තවත් පුද්ගලයින් දිරිමත් කෙරේ.

**සමීක්ෂණයට සහභාගි වූවන් බහුතරයකගේ ප්‍රතිචාරවලට අනුව, 2023 වසරේ දී මද්‍යසාර නිෂ්පාදන සඳහා වන බදු ඉහළ දැමීම මද්‍යසාර භාවිතය අවම වීම සඳහා හේතු වී ඇත.**




භාවිතය අවම කිරීම සඳහා ඵලදායි බදුකරණය සහ මිල ප්‍රතිපත්තීන්හි අවශ්‍යතාවය සනාථ කරයි. ඒ සඳහා අවශ්‍ය කරන උද්ධමනයට සහ මිලදී ගැනීමේ හැකියාවට අනුරූප වන විද්‍යාත්මක බදු සූත්‍රයක අවශ්‍යතාවය මෙම සමීක්ෂණ සොයා ගැනීම් මඟින් අවධාරණය කරයි.

ADIC
Alcohol and Drug Information Centre